# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2059/21 – 2018 පෙබරවාරි 20 වැනි අඟහරුවාදා – 2018.02.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

39 අ (1) වැනි වගන්තිය යටතේ නියමය

2014 මැයි මස 05 වැනි දින අංක 1861/6 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයෙහි* (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළ කරන ලද 2014 අංක 95 දරන ආඥාවේ සඳහන් ඉඩම් කොටස් රජය වෙත සම්පූර්ණයෙන්ම සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටස්වල සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම එකී ඉඩම් කොටස් අතුරින් මෙහි පහත 1 වන උපලේඛනයෙහි සඳහන් ඉඩම් කොටස පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4/3/10/2012/LRB/223.
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාගේ අංකය: WGSWD&EIP/ACQ/MH/08.

2018 පෙබරවාරි මස 14 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
මිහිකත මැදුර. ඉඩම් මහ ලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 526/ඩී, ජම්බුගස්මුල්ල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, ගංගොඩවිල ගමේ පිහිටි, සර්වේයර් ජනරාල්ගේ විසින් පිළියෙල කරන ලද අංක කො 9623 හා 2016.04.08 දිනැති මූලික පිඹුර අනුව සකසන ලද අංක CO/DSO/2016/670 දරන පැහැදිලි කිරීමේ අනුරේඛනයේ පෙන්නුම් කර ඇති පහත සඳහන් නම් වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – බෙලිගහකුඹුර, වැටකෙයියාගහකුඹුර හෙවත් අන්දරයා කුඹුර සහ නින්දේකුඹුර – ප්‍රමාණය: හෙක්. 0.0447**

උතුරට: කො 9623 මූලික පිඹුරේ කැබලි අංක 45 සහ පැපිලියාන පාරේ වරි. අංක 122ඒ; නැගෙනහිරට: පැපිලියාන පාරේ වරි. අංක 122ඒ සහ පැපිලියාන පාර; දකුණට: පැපිලියාන පාර සහ කො 9467 පිඹුරේ කැබලි අංක 18; බටහිරට: කො 9467 මූලික පිඹුරේ කැබලි අංක 18 සහ කො 9623 මූලික පිඹුරේ කැබලි අංක 45.

03 - 276

---

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

39අ (1) වැනි වගන්තිය යටතේ ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වන වගන්තිය (අ) අතුරු විධානය යටතේ පනවන ලද්ද වූද, අංක 1903/43 හා 2015.02.26 වැනි දින දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද්ද වූ ද, 2015 අංක 34 හා 2015.02.24 වැනි දින දරන ආඥවේ සවිස්තරව දක්වෙන ඉඩම් කොටස ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත

1A – G027152 – 112 (2018/02)
මෙම අතිවිශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

පැවරී තිබේ. එනමුත් මේ කියන ලද ඉඩම් කොටස් වල භුක්තිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙනුවෙන් තවම භාරගෙන නැත. එබැවින්, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම ඉඩම් අත්කර ගැනීමේ පනතේ 39(1) වැනි වගන්තිය යටතේ මාහට පැවරී ඇති බලතල අනුව අංක 1903/43 හා 2015.02.26 වැනි දින දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද ඉහත සඳහන් 2015 අංක 34 හා 2015.02.24 වැනි දින දරන ආඥාව මෙම නියමය මගින් ප්‍රත්‍යාදිෂ්ඨ කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/9/2014/WS/32.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: KDS/PDB/4/3/2/13.

2018 පෙබරවාරි මස 14 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
මිහිකත මැදුර ඉඩම් මහ ලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පල්ලේගම්පහ කොරළේ සුළු කොට්ඨාසයේ උඩතලවින්න ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක මහ/පීටීඩී/2014/343 හා 2014.10.09 දිනැති ප්‍රගමණ අනුරේඛනයේ සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 0.0506 ක් පමණ වන වෙහෙරගල වත්ත නැමති ඉඩම් කොටසට මායිම්.

01. **කැබලි අක්ෂර 'ඒ' – වෙහෙරගලවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0506**
උතුරට: මාර්ගය(ප්‍රා.ස.) සහ ඩී.එම්.ජී.සේනාරත්න බණ්ඩා සහ ඩී.එම්.ජී.සුමින්ද බණ්ඩාර හිමිකම් කියන වෙහෙරගල වත්ත; නැගෙනහිරට සහ දකුණට: ඩී.එම්.ජී.සේනාරත්න බණ්ඩා සහ ඩී.එම්.ජී.සුමින්ද බණ්ඩාර හිමිකම් කියන වෙහෙරගල වත්ත; බටහිරට: ඩී.එම්.ජී.සේනාරත්න බණ්ඩා සහ ඩී.එම්.ජී.සුමින්ද බණ්ඩාර හිමිකම් කියන වෙහෙරගල වත්ත, මාර්ගය (ප්‍රා.ස.).

03 - 277

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 39අ (1) වැනි වගන්තිය යටතේ නියමය

2003 මාර්තු මස 14 වැනි දින අංක 1279/35 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති *විශේෂ ගැසට් පත්‍රයෙහි* (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළ කරන ලද 2003 අංක 58 දරන ආඥාවේ ඇතුළත්, එන්යූඑස්ජී(පී) 99/121 දරන ප්‍රගමණ අනුරේඛනයේ සඳහන් ඉඩම් කොටස් සම්පූර්ණයෙන්ම රජය සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටස් සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම එකී ඉඩම් කොටස් අතරින් පහත උපලේඛනයේ සඳහන් එකී ඉඩම් කොටස පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: LD/05/2002/HW/204.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: කොත්/ඊ/4/9/20.

2018 පෙබරවාරි මස 14 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
මිහිකත මැදුර,
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රම්බොඩ කෝරළේ සුළු කොට්ඨාසයේ, තවලන්තැන්න ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක පීපී නු 2413 දරන මූලික පිඹුරේ පහත සඳහන් ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අංක 95 – තවලන්තැන්නවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0542**
උතුරට: කැබලි අංක 94; නැගෙනහිරට: කැබලි අංක 94, 93, 92 සහ ටීපී 49048; දකුණට: ටීපී 49048; බටහිරට: කැබලි අංක 94.

03 - 278

---

## ශුද්ධි පත්‍රිකාව

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 38 වැනි වගන්තිය (ආ) අතුරු විධානය යටතේ ආඥාව

**1992 අංක 12 දරන ආඥාව**

මගේ යොමු අංකය: 03ජේ/91/එල්ආර්බී/219.
ඉඩම් අත්කරගැනීමේ නිලධාරීන්ගේ යොමු අංකය:
ජීසීඑෆ්/ඒටීඑච්/එන්ජී/24/එල්ආර්.

අංක 2037/2 හා 2017.09.18 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* 1A පිටුවේ පළ කරන ලද 1992 අංක 12 දරන ආඥාවට අතුරුවිධාන අදළ අවසතු කිරීමේ නියමය පලකරන ලද දැන්වීමේ, 38 අතුරු විධාන ආඥාව පළ වී ඇති දිනය "1991 ජනවාරි මස 21" යන්න "1992 ජනවාරි මස 21" යන්න ලෙස සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2018 පෙබරවාරි මස 14 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

03-279

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.